ศ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2330/06 - 2023 මැයි මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2023.05.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය : බිය 3/1/1/503

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ /පරවශ්‍යතාවේ විස්තර* :-

ගම්පහ දිස්ත්‍රික්කයේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හෙයියන්තුඩුව ගමෙහි පිහිටි ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද මු.පි.ගම් 4263 සහ 2023.01.10 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01සිට 04 දක්වා කොටස්වලින් පෙන්නුම් කෙරෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0132 ක්වූ පහත විස්තර කර ඇති ඉඩම් කැබලි හතර (4):

01. කැබලි අංක 01

ඉඩමේ නම: දෙල්ගහවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: අධිවේගී මාර්ගය සඳහා වෙන් කල බිම; මුල් හිමිකම් පාන්නා: මාර්ග සංවර්ධන අධිකාරිය; ප්‍රමාණය: හෙක්. 0.0026.

02. කැබලි අංක 02

ඉඩමේ නම: දෙල්ගහවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; මුල් හිමිකම් පාන්නා: ඩබ්. ඩී. දීපාල් රුද්‍රිගු, අංක 168/3, බියගම; ප්‍රමාණය: හෙක්. 0.0081.

03. කැබලි අංක 03

ඉඩමේ නම: දෙල්ගහවත්ත, වරිපනම් අංකය 0215/063 ශ්‍රී දේවමිත්ත පාර; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; මුල් හිමිකම් පාන්නා: චමිත් ගයාන් කන්නන්ගර, අංක 349/13, දේවමිත්ත පෙදෙස, හෙයියන්තුඩුව; ප්‍රමාණය: හෙක්. 0.0021.

04. කැබලි අංක 04

ඉඩමේ නම: සඳහන්ව නැත; වර්තමාන ඉඩම් පරිහරණය: පාර; මුල් හිමිකම් පාන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0004.

ඉහත සඳහන් ඉඩම් කොටස්වල පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් පහත සඳහන් දිනයන්හි දී පහත සඳහන් වේලාවට බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතු යි.

| දිනය | කැබලි අංකය | වේලාව |
|---|---|---|
| 2023.05.23 | 01 සහ 02 | පෙ.ව. 9.30 |
| 2023.05.24 | 03 සහ 04 | පෙ.ව. 9.30 |

තව ද, 2023 මැයි මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම්/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් 02ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

**එස්. ඒ. චන්දිමා සූරියආරච්චි,**
ප්‍රාදේශීය ලේකම් බියගම.

2023 අප්‍රේල් මස 28 වැනි දින,
බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
සපුගස්කන්ද, මාකොළ.

EOG 05-0002